881

# පාසල් ළමුන්ගේ මතක ශක්තිය වර්ධනය කිරීම සඳහා සිනහ ප්‍රතිකාරයේ උපයෝගීතාව පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

## (A Psychological Study To Investigate The Usability Of Laughter Therapy To Develop The Memory Of School Children)

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
17 MAR 2014
UNIVERSITY OF KELANIYA

ආර්.එම්.ජී. කරුණාරත්න මයා.

ශි.ලි. අංකය: **FGS/PHIL/MC/08/003**



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 881 |
| වර්ග අංකය: | |



කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ සමාජීය විද්‍යාපති **(MSSc)** උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

2012

## සංක්ෂේපය

කැළණිය විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සම්පූර්ණ කිරීමට අදාලව ''පාසල් ළමුන්ගේ මතක ශක්තිය වර්ධනය කිරීම සඳහා සිනහ ප්‍රතිකාරයේ උපයෝගීතාව පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්'' යන මාතෘකාව යටතේ මෙම අධ්‍යයනය සිදු කර ඇත. එහිදී මාතලේ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් දෙකක ළමුන් නියදිය ලෙස ගත් අතර එක් පාසලක ළමුන් පාලිත කණ්ඩායම ලෙසත් අනෙක් පාසලේ ළමුන් මැදිහත්වීමේ කණ්ඩායම ලෙසත් යොදගෙන ඇත. ''මතක ශක්තිය වර්ධනය කිරීම සඳහා සිනහ ප්‍රතිකාරය භාවිත කළ හැකිය'' යන්න අධ්‍යයනයේ උපන්‍යාසය විය. යහපත් මානසික සෞඛ්‍යයක් නොමැති සන්දර්භයන් තුළ අපේක්ෂා කරන නිෂ්ඨාවන් සාධනය කිරීම දුෂ්කර බැවින් පාසල් ළමුන් මුහුණපාන පීඩාකාරී මනෝභාවයන්ගෙන් නිදහස් කර ඔවුන්ගේ මතක ශක්තිය දියුණු කිරීම සඳහා සිනහ ප්‍රතිකාරය යොදගත හැකිද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික ම අරමුණ විය. පාලිත හා මැදිහත්වීමේ කණ්ඩායම් ද්විත්වයටම එකම මතක පරීක්ෂණය පෙර සහ පසු වශයෙන් භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණයේ දී මැදිහත්වීමේ කණ්ඩායමේ පූර්ව සහ පසු ලකුණු අතර පැහැදිලි වෙනසක් ඇත. එමනිසා මතක ශක්තිය දියුණු කිරීම සඳහා සිනහ ප්‍රතිකාරය භාවිත කළ හැකිය යන උපන්‍යාසය මෙම අධ්‍යයනයෙන් සනාථ වේ.

මුඛ්‍ය පද:

ක්ලමථය, ධාරණය, විස්මෘතිය, කායඃසාධනය, ඉගෙනුම, චිත්තවේග, සිනහ ප්‍රතිකාරය